මාධ්‍ය නිවේදන අංක 09

මැතිවරණ කොමිෂන් සභාව

**2021.03.23 දින රැස් වූ මැතිවරණ කොමිෂන් සභාව මතු දැක්වෙන තීරණ ගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.**

- පවතින නීතිය අනුව දේශපාලන පක්ෂයක් ලියාපදිංචි කරනු ලබන්නේ ජාතික පක්ෂයක් වශයෙන් බැවින් දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීමේ දී එම පක්ෂවල නිල නාම යම් ආගමික හෝ වාර්ගික හෝ වශයෙන් නම් කෙරෙන්නේ නම් එවැනි පක්ෂ ලියාපදිංචි නොකිරීම.

- එසේම දැනට ලියාපදිංචි කොට ඇති පිළිගත් දේශපාලන පක්ෂවල නිල නාම එවැනි ආගමික හෝ වාර්ගික හෝ වශයෙන් නම් කොට තිබේ නම් ඒවා සංශෝධනය කිරීම හා එම පක්ෂවල ව්‍යවස්ථාවල ද එවැනි වගන්ති ඇතුළත් වන්නේ නම් එය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධානවලට පටහැනි හෙයින් ඒ පිළිබඳව අදාළ දේශපාලන පක්ෂ දැනුම්වත් කර එවැනි පක්ෂවල නිල නාම හා පක්ෂ ව්‍යවස්ථා සංශෝධනය සඳහා සාධාරණ කාල සීමාවක් ලබා දීම.

- වයස අවුරුදු 18 සම්පූර්ණ වූ තැනැත්තන්ට මාස 03 ක් වැනි කෙටි කාලයක් තුළ දී ඡන්ද බලය ලබා දීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ යෝජනාවකට අනුව 1980 අංක 44 දරණ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතට අදාළ සංශෝධන අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා ජනාධිපතිතුමාගේ නියමය පරිදි 2021.03.16 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති අතර එය පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට අවශ්‍ය ඉදිරි පියවර ගැනීමට කටයුතු කිරීම.

- 1985 වර්ෂයේ සිට උතුරු නැගෙනහිර ප්‍රදේශවල පැවති යුධමය වාතාවරණය හේතු කොට ගෙන යාපනය හා වන්නි මැතිවරණ කොට්ඨාශවල ජීවතුන් අතර නොමැති බවට තහවුරු වූ තැනැත්තන් පිළිබඳ තොරතුරු රජයේ ගැසට් පත්‍රයේ, මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ, අදාළ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරී කාර්යාලවල 2021.04.23 දක්වා ප්‍රදර්ශනය කොට තවදුරටත් එම තැනැත්තන් ජීවතුන් අතර සිටී නම් 2020 ඡන්ද හිමි නාම ලේඛනයට ඇතුළත් වීම සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබා දීම.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2021.03.24